# A Study on the Influence of Tantric Teachings on Buddhism

## බුදුසමය විෂයෙහි තාන්ත්‍රික ඉගැන්වීම්හි බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

මානවකයාගේ ආරම්භය යම් කලෙක සිදුවී ද, එකල "තන්ත්‍ර" ශාස්ත්‍රයේ ආරම්භය සිදු වූ බව බොහෝ විද්වතුන්ගේ මතයයි. එබැවින් "තන්ත්‍ර" කවදා, කවරෙකු විසින්, කෙසේ ආරම්භ කරන ලද්දේදැයි විමසීම ශාස්ත්‍ර විරෝධී ය. "තන්ත්‍ර" නමින් හැඳින්වෙන මෙම ශාස්ත්‍රය මිනිසාගේ ප්‍රබල වූ අංග දෙකක් නියෝජනය කරනු ලබයි. එනම් "ශබ්දය" හා "චලනය"යි. සන්නිවේදනයේ දී ප්‍රබල මාධ්‍ය වන්නේ ද මෙම අංග දෙකයි. ක්‍රමයෙන් සමාජගත වූ මිනිසා සිය ජීවනෝපාය පිණිස විශ්ව ශක්තීන් උපයෝගි කොට ගත්හ. අව්ව, වැස්ස ඒ අතර ප්‍රධාන සාධකයෝ ය. මෙම විශ්ව සාධක මිනිසාගේ අවශ්‍යතාවන් අනුව මෙහෙයවාගන්නේ කෙසේ ද, ඒවා තමාට අවශ්‍ය ආකාරයෙන් පාලනය කිරීම පිණිස කුමක් කළ යුතු ද' යන්න සඳහා පිළිතුර වූයේ "තන්ත්‍ර" ශාස්ත්‍රයේ නිර්මාණයයි. මෙය ගුප්ත ශාස්ත්‍රයක් ලෙස දැක්වෙන අතර, සරල හා ඉතා කෙටි භාවිතයන් නිසා සීඝ්‍රයෙන් ජනප්‍රිය විය. ක්‍රි.පූ. 06 වන සියවසේ දී පමණ නිර්මාණය වන්නා වූ බුදුසමය තුළ ද පසුකාලීනව මෙම තාන්ත්‍රික ලක්ෂණ ප්‍රකටව දැකගත හැකි ය. වෛදික, ආරණ්‍යක, උපනිෂද් සාහිත්‍යයන් තුළ වර්ධනය වූ උක්ත තාන්ත්‍රික ලක්ෂණ බුදුසමය වෙත ඇතුල්වීම වැළැක්විය නොහැකි කරුණක් වූ බව පෙනේ. එය බුද්ධකාලීනව ද, ඉන් පසුව ද, නිකායාන්තර බුදුසමය තුළ ද ක්‍රමයෙන් වර්ධනය වී ඇති අයුරු දැකගත හැක. ආදි බෞද්ධ සූත්‍ර දේශනා තුළ තන්ත්‍ර, මන්ත්‍ර, ධාරණී පාඨ ඇතුලත් වීම ද, විනය පිටකයේ ඇතැම් විනය නීති ගුප්ත ශාස්ත්‍ර ඉගෙනීම, පිළිපැදීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දේශනා වී තිබීම ද නිදසුන් වශයෙන් පෙන්වාදිය හැක. දී.නි. ආටානාටිය සූත්‍රය, දී.නි. මහාසමය සූත්‍රය වැනි සූත්‍ර දේශනා මෙම තාන්ත්‍රික ලක්ෂණ ප්‍රකටව දැකිය හැකි සූත්‍ර දේශනාවෝ ය. එමෙන් ම තාන්ත්‍රික ඉගැන්වීම්හි අන්තර්ගත ප්‍රාතිහාර්ය ක්‍රමවේදයන්, යන්ත්‍ර මන්ත්‍ර භාවිතයන් භික්ෂුව විසින් කිසිදු අයුරකින් භාවිත නොකළ යුතු බව බෞද්ධ විනයෙහි සඳහන් වේ. තන්ත්‍රයන්ගේ බලපෑම බුදුසමය වෙත බොහෝ සෙයින් සිදුවන්නේ නිකායාන්තර බුදුසමයත් සමඟය. සරල ක්‍රමවේදයක් ඔස්සේ ලෝකෝත්තර සුවය සෙවීමට මිනිසා යොමුවීම මෙයට ප්‍රමුඛ සාධකය විය. මෙකී ලක්ෂණ ප්‍රකටව දැකගත හැකි වන්නේ මහායාන බුදුසමය තුළින් ය. ඉතා දීර්ඝ වූ සූත්‍ර දේශනා කෙටි කොට අර්ථ ගන්වා නිර්මාණය කරන ලද ධාරණී හා මන්ත්‍ර මහායාන සූත්‍ර සාහිත්‍යයේ බොහෝ සෙයින් හමු වේ. තාන්ත්‍රික බලපෑමෙන් මිදීමට ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායට ද හැකියාවක් ලැබී නොමැත. ඒ අනුව ථෙරවාද සූත්‍ර දේශනාවන් තුළ ද උක්ත තාන්ත්‍රික ලක්ෂණ හමු වේ. ඒවා පසුකාලීනව සම්ප්‍රදායානුගත ඉගැන්වීම් විෂයෙහි එකතු වූ බව බොහෝ විද්වතුන්ගේ මතයයි. එමෙන් ම එවැනි බොහෝ සූත්‍ර දේශනාවන් ලෞකික අපේක්ෂාවන් සාධනය උදෙසා නිර්මාණය වී ඇති අයුරු ද පෙනේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් ආදි බෞද්ධ හා නිකායාන්තර ඉගැන්වීම් විෂයෙහි තාන්ත්‍රික බලපෑම සිදුවී ඇති අයුරු නිදසුන් සහිතව පෙන්වාදීමට අපේක්ෂිත ය.

ප්‍රමුඛ පදඃ තන්ත්‍ර, මන්ත්‍ර, බුදුසමය, ස්වභාව ධර්මය, නිර්වාණය